ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි: 02/2017

මගේ අංකය : PA/CS/POLICY/ව්‍යවස්ථා සංශෝධන

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය,

කොළඹ 07

2017.05.05

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉමට</u>

<u>අදාල පරිගණක පරීක්ෂණය සම්බන්ධවයි</u>

2004.01.01 දින සිට 2013.12.11 (නව සේවා ව්‍යවස්ථාව ප්‍රසිද්ධ කරන ලද දිනය) දින දක්වා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය සඳහා බඳවා ගනු ලැබූ, මේ වන විටත් එම සේවයේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල පරිගණක පරීක්ෂණය සමත් වී නොමැති හෝ එම පරිගණක පරීක්ෂණයෙන් නිදහස් වීමට නොහැකිව සිටින නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ PSC/EST/5/2/25/I(II)/2012 හා 2017.04.05 දිනැති ලිපියෙන් පහත සඳහන් සහනය ලබා දී ඇත.

- එම නිලධාරීන්, පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව එනම් 2004.12.24 දිනැතිව ප්‍රකාශයට පත් කළ අංක 1372/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ අංක 05 ඡේදය යටතේ දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම කොටසේ 5.1 සහ 5.1.2 කොටස් අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කිරීම

කේ.වී.පී.එම්.ජේ. ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්